# කාර්යසාධන වාර්තාව
# சாதனைகள் அறிக்கை
# Performance Report

# 2014




ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය
உற்பத்தித்திறன் ஊக்குவிப்பு அமைச்சு
Ministry of Productivity Promotion

# පටුන

පිටු අංකය


| | | |
|---|---|---|
| **1.** | අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවුඩය | **3** |
| **2.** | හැඳින්වීම | **4** |
| **3.** | අමාත්‍යාංශයේ ආයතනික ව්‍යුහය | **5** |
| **4.** | දැක්ම, මෙහෙවර, අරමුණු | **7** |
| **5.** | මානව සම්පත් සංවර්ධනය පුහුණු වැඩසටහන් (දේශීය) | **8** |
| **6.** | මානව සම්පත් සංවර්ධනය පුහුණු වැඩසටහන් (විදේශීය) | **10** |
| **7.** | විශේෂ වැඩසටහන් (දැයට කිරුළ) | **12** |
| **8.** | අභ්‍යන්තර විගණන අංශය | **14** |
| **9.** | වියදම් සාරාංශය | **15** |
| **10.** | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය | **20** |



## ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශයේ
## ලේකම්තුමාගේ පණිවුඩය

ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශයේ 2014 වර්ෂයේ ප්‍රගතිය ඇතුළත් කාර්ය සාධන වාර්තාවට පණිවුඩයක් නිකුත් කරන්නේ ඉතාමත් සතුටිනි. 2010 නොවැම්බර් මස 22 දින ඵලදායිතා විෂය වෙනුවෙන් වෙනම කැබිනට් අමාත්‍යාංශයක් පිහිටුවීමෙන් පසුව, මහින්ද චින්තන ඉදිරි දැක්මෙන් අපේක්ෂිත පුළුල් අරමුණු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් 2014 වසර තුළ වැඩසටහන් දිවයින පුරා ජාතික මට්ටමෙන් ක්‍රියාත්මක කරන ලදි.

ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය රාජ්‍ය, පෞද්ගලික,පාසල් හා ප්‍රජා යන සෑම අංශයක්ම ඉලක්ක කර ගනිමින් ඵලදායිතා වැඩසටහන් ක්‍රියාත්මක කරයි. මෙම වැඩසටහන් මඟින් ඵලදායිතා සංකල්පය පිළිබඳව රාජ්‍ය හා පෞද්ගලික ආයතන හා ප්‍රජාව දැනුවත් කරන අතර එමඟින් ඵලදායිතා ප්‍රවර්ධනය තුළින් ජාතික සංවර්ධන ඉලක්ක වඩාත් ඵලදායිව සපුරා ගැනීමට සැළසුම් කර ඇත. මෙම වර්ෂයේද ජාතික ඵලදායිතා සම්මාන උළෙල පවත්වා තෝරාගත් ආයතන සඳහා සම්මාන පිරිනැමීම සිදු කරන ලද අතර රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල ඵලදායිතාව කාර්යක්ෂමතාව නැංවීමට මෙම තරඟාවලිය ඉමහත් පිටුවහලකි.

එමෙන්ම මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන ලද ස්වයං රැකියා පුහුණු වැඩසටහන්, ව්‍යවසායකත්ව පුහුණුව තුළින් ස්වයං රැකියා සඳහා විධිමත් අවබෝධයක් ලබා දීම, අභ්‍යන්තර හා බාහිර උපාධි අපේක්ෂකයින් හා පාසැල් සඳහා මාර්ගෝපදේශන වැඩසටහන්, විරැකියා අවම කිරීමේ අරමුණින් ක්‍රියාත්මක රැකියා ගවේෂණ වැඩසටහන් හා රැකියා පොළවල් පැවැත්වීම ආදිය තුළින් රටේ ශ්‍රම ඵලදායිතාවය ඉහළ නැංවීමට හා සෑම අංශයකින්ම කාර්යක්ෂම ශ්‍රම බලකායක් ගොඩ නැංවීමට දායකත්වය සපයා ඇත. 2012 ඔක්තෝම්බර් 30 වන දින එළිදැක්වූ ජාතික මානව සම්පත් හා සංවර්ධනය, රැකියා නිර්මාණ ප්‍රවර්ධනය හා වෘත්තිය මාර්ගෝපදේශන යන ක්ෂේත්‍රවල මෙම දෙපාර්තමේතුවේ කාර්ය භාර්ය තව දුරටත් පුළුල් වී ඇත.

ශ්‍රී ලංකාව සංවර්ධනය කරා යන ගමනේදී ඵලදායිතා ප්‍රවර්ධන ඉතා වැදගත් වන්නේය.මෙම කාර්ය භාර්ය ඉටු කිරීමේ දී නායකත්වය ගෙන කටයුතු කළ ගරු ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍ය බෂීර් සේගුදාවුද් මැතිතුමාගේ උපදෙස් හා මඟ පෙන්වීම ඉතා ප්‍රශංසනිය බව මෙහිදි සිහිපත් කරමි. එසේම මෙම අමාත්‍යාංශයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා ඉතා කාර්යක්ෂමව හා උද්යෝගිමත්ව කටයුතු කල අමාත්‍යාංශයේ අතිරේක ලේකම්තුමා ඇතුළු මාණ්ඩලික නිලධාරීන්ටත් සෙසු සියලු කාර්ය මණ්ඩලයටත්, ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ඇතුළු සියලු කාර්ය මණ්ඩලයටත්, මානව හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයටත් ඔවුන් කරන ලද සේවය අගය කිරිමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. ඉදිරි වර්ෂවලදි ශ්‍රී ලංකාව තුළ ඵලදායිතාව ප්‍රවර්ධනය තුළින් සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමට හැකි ඉහළම දායකත්වය ලබාදීමට අපේක්ෂා කරන අතර ඒ සඳහා සෑම අංශයකම සහයෝගය අපේක්ෂා කරමි.

උපාලි මාරසිංහ
ලේකම්
ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය

# කාර්යසාධන වාර්තාව 2014

ඵලදායි හා තරඟකාරී ශ්‍රම බලකායක් බිහි කිරීමේ අරමුණින් 2010 - 2016 කාලය තුළ රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට පුළුල් සැලැස්මක් යටතේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී. එමඟින් ශ්‍රී ලංකාවේ ඵලදායිතාව ප්‍රවර්ධනය කිරීම සහ ජාත්‍යන්තර තරඟකාරිත්වයට මුහුණ දීමට සුදුසු තත්ත්වයේ ශ්‍රම බලකායක් පෙරදැරිව සමාජ, ආර්ථික සංවර්ධනය කරා ළඟා වීම අපේක්ෂා කරනු ලබයි.

ඵලදායිතා ප්‍රවර්ධනයේ ප්‍රධාන ප්‍රතිපත්ති සම්පාදකයා මෙන්ම තරඟකාරී මානව සම්පතක් බිහි කිරීමේ පුරෝගාමියා වශයෙන් මෙම අමාත්‍යාංශය රටේ ඵලදායිතාව වැඩි කිරීමේ අරමුණින් සියලුම අංශයන් දැනුවත් කිරීමේ කාර්යයේ නිරත වී සිටී. ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය යටතේ වූ මිනිස්බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව සහ ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය මෙම අරමුණු ළඟා කර ගැනීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

රටේ සියලුම රාජ්‍ය ආයතනවල මෙන්ම පාසල්, පෞද්ගලික අංශයේ ආයතන හා ප්‍රජාව සඳහා ඵලදායිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ආයතනය වශයෙන් ඵලදායිතා ලේකම් කාර්යාලය වාර්ෂිකව විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. එසේම ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය ජාතික ඵලදායිතා සම්මාන තරඟාවලිය වාර්ෂිකව සංවිධානය කර පවත්වනු ලබන අතර, මෙමඟින් රාජ්‍ය ආයතනවල සේවා සැපයීම වඩාත් කාර්යක්ෂමව හා ගුණාත්මක තත්ත්වයෙන් පවත්වාගෙන යාමටත් සේවාලාභීන්ට තෘප්තිමත් අයුරින් සේවාවන් සැපයීමටත් හැකි ආකාරයට ආයතන සහ මානව සම්පත ප්‍රතිනිර්මාණය කිරීමට හැකියාවක් ලැබේ.

ජනාධිපති ලේකම් කාර්යාලය විසින් 2014 වර්ෂයේ සිට සියලුම අමාත්‍යාංශවල සහ පළාත් සභාවල සියලුම ආයතන ජාතික ඵලදායිතා සම්මාන තරඟාවලිය සඳහා සහභාගී කරවන ලෙස සියලුම අමාත්‍යාංශ ලේකම්වරු හා සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරු දැනුවත් කිරීම ඵලදායිතා ප්‍රවර්ධනයේ නව සංධිස්ථානයක් ලෙසින් හැඳින්විය හැකිය. එසේම අමාත්‍යාංශ ලේකම් සහ අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල ප්‍රධානීන් විසින් කැබිනට් අමාත්‍යාංශ ලේකම්වරු, දිස්ත්‍රික් ලේකම්වරු, ප්‍රධාන ලේකම්වරු, ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කිරීමට කටයුතු සිදු කර ඇති අතර, මේ වන විට අමාත්‍යාංශ ලේකම්වරු ගණනාවක් දැනුවත් කර ඇත.

ශ්‍රී ලංකාවේ කුසලතා සපිරි මානව සම්පතක් බිහි කිරීම සඳහා හා රැකීරක්ෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. රාජ්‍ය හා පෞද්ගලික අංශය අනෙකුත් සියලුම පාර්ශවයන්ගේ පුළුල් සහභාගිත්වයෙන් ගොඩ නැංවූ ශ්‍රම වෙළෙඳපොළ පිළිබඳ තොරතුරු පද්ධතියක් සකස් කරමින් පවතින අතර, ශ්‍රම බලකායට අලුතින් එකතු වන පිරිස සහ අධ්‍යාපනය ලබන සහ රැකියා අපේක්ෂකයින් සඳහා අනාගත වෘත්තීය ගමන්මඟ, ශ්‍රම වෙළෙඳපොළ නව ප්‍රවණතා පිළිබඳ උපදේශනය හා මඟ පෙන්වීම නව තාක්ෂණික ක්‍රම හරහා ලබා දීම සිදු කරයි.

රජයේ ප්‍රතිපත්ති රාමුවට අනුකූලව 2013 සිට 2016 තුන් අවුරුදු කාලය සඳහා අමාත්‍යාංශය විසින් මධ්‍ය කාලීන ප්‍රතිපත්ති රාමුවක් සකස් කර ඇති අතර, 2014 වසරේ ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් මෙම මධ්‍ය කාලීන ප්‍රතිපත්ති රාමුවට අනුකූලව ආරම්භ කළ අතර 2014 දෙසැම්බර් 31 වන විට සැලකිය යුතු මට්ටමේ ප්‍රතිඵල ළඟාකර ගෙන ඇත. එසේම

අමාත්‍යාංශයට නව අරුතක් එක් කරමින් කලක් ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ලෙස සේවය කල  උපාලි මාරසිංහ මහතා 2014 ජුනි මස මෙම අමාත්‍යාංශයේ නව ලේකම්වරයා වශයෙන් වැඩ භාර ගැනීම ද සිදුවිය.

මෙම කාර්ය සාධන වාර්තාව 2014 ජනවාරි මස සිට **දෙසැම්බර් 31** මෙම අමාත්‍යාංශයේ හා මෙම අමාත්‍යාංශය යටතේ පවතින අනෙකුත් ආයතනවල කාර්යයන්හි භෞතික ප්‍රගතිය හා මූල්‍ය ප්‍රගතිය ගෙනහැර දක්වයි. මෙම වාර්තාව ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය, ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය සහ මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය ලෙස කොටස් 03 කින් සමන්විත වේ.

**ඵලදායිතා ප්‍රවර්ධනය සඳහා වන**
**මධ්‍ය කාලීන උපාය මාර්ගික සැලැස්ම**
**2013-2016**




## අමාත්‍යාංශයේ ආයතනික ව්‍යුහය

**ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය**

- **මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව**
- **ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය**

## ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය

### ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය

ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය ඵලදායිතා වැඩසටහන් ක්‍රියාත්මක කරන ආයතනය වේ. ඵලදායිතා ලේකම් කාර්යාලය 1994 දී කම්කරු අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කරන ලද අතර රටේ ඵලදායිතාවය වැඩිකිරීම සඳහා වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදී. මහින්ද චින්තන - ඉදිරි දැක්ම ජාතික ප්‍රතිපත්තිය අනුව ඉදිරි දශකය තුළ ඵලදායිතාව වාර්ෂිකව සියයට 5 – 6 ක ප්‍රමාණයකින් වැඩිකිරීමේ වගකීම ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය වෙත පැවරී ඇත. වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ආයතනය වශයෙන් ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන්, පුහුණු හා උපදේශක සේවා, පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් පවත්වනු ලබයි. එසේම ආසියානු ඵලදායිතා සංවිධානයේ සම්බන්ධීකාරක වශයෙන් ද කටයුතු කරයි.

### මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යාංශය යටතේ අංශයක්ව පැවති මිනිස්බල හා රැකියා අංශය මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව ලෙස වර්ෂ 2010 දී ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කරන ලදි. අංක 1640/31 (2010.02.12) දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ විධිවිධාන අනුව පිහිටවනු ලැබූ මෙම දෙපාර්තමේන්තුව ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. ලංකාවේ මානව සම්පත් හා රැකිරක්ෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන කාර්යභාරයක් මෙම දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. දෙපාර්තමේන්තුවේ අරමුණු අතර කුසලතා සපිරි, ශක්තිමත්, තරඟකාරී ශ්‍රම බලකායක් බිහිකිරීම, විරැකියාව අවම කිරීම සහ ශ්‍රම වෙළඳපොළ තොරතුරු පද්ධතියක් ඇති කිරීම ප්‍රධාන වේ. මෙම අරමුණුවලින් යුතුව දෙපාර්තමේන්තුව ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම, රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම, වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පැවැත්වීම හා ශ්‍රම වෙළඳපොළ තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාම කරනු ලබයි.

***Productivity isn't everything, but in the long-run it's nearly everything…………………………..***




## දැක්ම

සියලුම අංශයන්හි ඉහළ ඵලදායිතාවයක් ඇති කිරීම තුළින් උසස් ජීවන තත්ත්වයක් හා ගුණාත්මක ජීවිතයන් ඇති කිරීම.

## මෙහෙවර

කුසලතා සපිරි, ක්‍රියාශීලී හා තරගකාරී ශ්‍රම බලකායක් නිර්මාණය කිරීමට අවශ්‍ය වන්නා වූ ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායන් සකස් කිරීම හා වාර්ෂිකව සියයට 5 – 6 කින් ඵලදායිතාව ප්‍රවර්ධනය කිරීමේ විශිෂ්ඨතම කේන්ද්‍රස්ථානය බවට පත්වීම.

## අරමුණු

1. ඵලදායිතා ප්‍රවර්ධනය හා ශ්‍රම වෙළඳපොළ සංවර්ධනයට අදාල ප්‍රතිපත්ති සම්පාදනය හා ප්‍රතිසම්පාදනය.
2. ශ්‍රී ලංකා ආර්ථිකයේ සියලු අංශවල ඵලදායිතාව ඉහළ නැංවීම සඳහාත් ශ්‍රම වෙළඳපොළෙහි ශ්‍රමික ක්‍රියාකාරිත්වය සඳහාත් අවශ්‍ය වන්නා වූ චිත්තෝද්ගය ඇති කිරීමේ කාර්යයන් කිරීම.
3. ඵලදායිතා ප්‍රවර්ධනය සහ ශ්‍රම වෙළඳපොළ ප්‍රතිපත්ති වැඩසටහන් සහ ව්‍යාපෘතින් ක්‍රියාත්මක කිරීම සඳහා අධීක්ෂණය සහ සම්බන්ධීකරණ කාර්යයන් ඉටුකිරීම.
4. ශ්‍රී ලංකා ආර්ථිකයේ සියලු මට්ටම්වල සහ පැතිකඩයන්හි සිදුවන ඵලදායිතා කළමනාකරණ ක්‍රමවේද සංවර්ධනය, අධීක්ෂණය කිරීම හා අදාල මාර්ගෝපදේශ සැපයීම.
5. ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය වන ආයතනික රාමුවක් සහ ක්‍රමවේද ප්‍රතිස්ථාපනය කිරීම.

## කාර්ය මණ්ඩල පුහුණු - 2014




ආයතනික අරමුණු ළඟා කර ගැනීම සඳහා පුහුණු කාර්ය මණ්ඩලයක් සිටීම අත්‍යවශ්‍ය සාධකයකි. ශ්‍රම බලකාය සවිබල ගැන්වීම හා හැකියාව ඇති පිරිසක් බවට පත් කිරීම ආයතනයේ සාර්ථකත්වයට හේතු වේ. මෙම අමාත්‍යාංශයට 2013 වර්ෂයේ බඳවාගත් උපාධිධාරීන් ඇතුළුව කාර්ය මණ්ඩලයේ කුසලතා වැඩිදියුණු කිරීමත් විෂයානුබද්ධ පුහුණුව ලබාදීමටත් අවධානය යොමු කරන ලදී. එසේම සේවා අවශ්‍යතාව මත භාෂා පුහුණුව ලබාදීමට ක්‍රියා කර ඇත.




| පුහුණුවේ නම | ආයතනය | සහභාගී වූ ප්‍රමාණය |
|---|---|---|
| දෙමළ භාෂා උසස් පාඨමාලාව | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | 08 |
| සිංහල භාෂා උසස් පාඨමාලාව | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | 01 |
| ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 02 |
| දෙමළ භාෂා මූලික පාඨමාලාව | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | 04 |
| රජයේ වාහන පරිහරණය පිළිබඳ පුහුණු පාඨමාලාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 01 |
| කාර්යාල කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 01 |
| ආයතන සංග්‍රහය සහ කාර්ය පටිපාටික රීති භාවිතය පිළිබඳ පුහුණු පාඨමාලාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 02 |
| ආපදා කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 01 |
| කාර්යාල ක්‍රම | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය | 12 |
| ප්‍රවාහන කළමනාකරණය | ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනය | 01 |
| ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 03 |
| ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 02 |
| රියදුරන් සඳහා නිපුණතා සංවර්ධන වැඩමුළුව | නිපුණතා සංවර්ධන පදනම | 02 |

| පුහුණුවේ නම | ආයතනය | සහභාගී වූ ප්‍රමාණය |
|---|---|---|
| මුදල් අයකැමි තනතුරේ කාර්ය හා වගකීම පිළිබඳ පුහුණුව | නිපුණතා සංවර්ධන පදනම | 01 |
| කාර්යාල කාර්ය සේවයේ කාර්යාභිවර්ධනය පිළිබඳ පුහුණුව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 01 |
| ආයතන සංග්‍රහය සහ කාර්ය පටිපාටික රීති භාවිතය පිළිබඳ පුහුණු පාඨමාලාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 01 |
| ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 01 |
| නවක රාජ්‍යකළමනාකරණ නිලධාරීන්ගේ සේවාරම්භක පුහුණු පාඨමාලාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 04 |
| දෙමළ භාෂා මූලික පාඨමාලාව | ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය | 29 |
| දෙමළ භාෂා විශේෂ කථන පාඨමාලාව | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | 03 |
| පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම සම්බන්ධ මූලික ප්‍රායෝගික පුහුණුව | ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය | 25 |
| කාර්ය මණ්ඩල පුහුණු | ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය | 75 |
| ඉංග්‍රීසි සහතික පත්‍ර උසස් පාඨ මාලාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 01 |
| ගිණුම් පොත්පත් ක්‍රමානුකූලව නඩත්තු කිරීම | නිපුණතා පියස | 01 |
| නවක රාජ්‍ය කළමණාකරණ සහකාරවරුන්ගේ සේවාරම්භක පුහුණුව | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය<br>කොළඹ | 04 |

Human Resources
Training and Development Program
PAVING THE WAY TO SUCCESS

## පුහුණු වැඩසටහන් (විදේශීය)






*මඟපෙන්වීම හා පහසුකම් සැපයීම තුළින් සේවා ස්ථාන කාර්යක්ෂමතාව හා සඵලමත් බව වැඩි කිරීම.....*

2014 වසරේ දී අමාත්‍යාංශයේ සහ ඒ යටතේ ඇති ආයතනවල නිලධාරීන් විදේශීය පුහුණු වැඩසටහන් රාශියකට සහභාගී විය. ආසියානු ඵලදායිතා සංවිධානය මානව ඵලදායිතාව ඉහළ නැංවීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ඇති අතර, ඒ සඳහා වාර්ෂිකව පුහුණු වැඩසටහන් රාශියක් සංවිධානය කරනු ලබයි. ඒ අනුව ආසියානු ඵලදායිතා සංවිධානය විසින් සංවිධානය කරන ලද විශේෂයෙන්ම ඵලදායිතා සංකල්ප සම්බන්ධ පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් විශාල පිරිසක් සහභාගී කරවනු ලැබීය.

| විස්තරය | රට | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|---|
| **ආහාර සැකසීමේ සුළු හා මධ්‍ය පරිමාණ ආයතන හා පර්යේෂණ ආයතනවල ප්‍රාදේශීය ව්‍යාපාර සහයෝගිතාව පිළිබඳ බහුපාර්ශවික නිරීක්ෂණ චාරිකාව** | ජපානය | අයි.එම්.පී.ගුණරත්න මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| **ඵලදායිතා ප්‍රවර්ධන සුභාවිතයන් පිළිබඳ ජාතික ඵලදායිතා සංවිධාන වැඩමුළුව** | කොරියාව | ආචාර්ය දමිතා ද සොයිසා මිය | ලේකම් |
| **ආසියානු ඵලදායිතා සංවිධානයේ 56 වන සැසිවාරය** | වියට්නාමය | ආචාර්ය දමිතා ද සොයිසා මිය | ලේකම් |
| **ජාතික ඵලදායිතා සංවිධාන සමඟ ද්වි පාර්ශවික සහයෝගීතාව** | ඉන්දුනීසියා සහ මැලේසියාව | ආචාර්ය දමිතා ද සොයිසා මිය | ලේකම් |
| **ජාතික ඵලදායිතා සංවිධාන සමඟ ද්වි පාර්ශවික සහයෝගීතාව** | ඉන්දුනීසියා සහ මැලේසියාව | ඩබ්ලිව්.එම්.ආර්.පී. වීරසිංහ මයා | අතිරේක ලේකම් |
| **රාජ්‍ය හා සේවා අංශයේ ඵලදායිතා මිනුම් දඬු පිළිබඳ වැඩමුළුව** | ඉන්දියාව | ඩබ්ලිව්.එම්.ආර්.පී. වීරසිංහ මයා | අතිරේක ලේකම් |
| **තිරසාරත්වය මුදුන් පමුණුවා ගැනීම සඳහා අනාගත මතු පරපුර බලගැන්වීම පිළිබඳ ජාත්‍යන්තර සමුළුව** | තායිපේ - චීනය | ඩබ්.එන්.කේ.සෝමරත්න මයා | සංවර්ධන සහකාර |

| විස්තරය | රට | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|---|
| රාජ්‍ය සේවා කළමණාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන | තායිපේ - චීනය | ඩබ්ලිව්.එම්.එම්.මද්දුමබණ්ඩාර මයා | අධ්‍යක්‍ෂ, ජා.එ.ලේ කාර්යාලය |
| පාරිසරික නම් පත් සහ ප්‍රකාශන (ISO 14021, 14024 සහ 14025) සම්බන්ධ පුහුණු පාඨමාලාව | බංගලාදේශය | පී.ඒ.එස්.කරන්නාගොඩ මයා | සංවර්ධන සහකාර |
| පාරිසරික නම් පත් සහ ප්‍රකාශන (ISO 14021, 14024 සහ 14025) සම්බන්ධ පුහුණු පාඨමාලාව | බංගලාදේශය | ආර්.එම්.ජී.පී.රාජපක්‍ෂ මයා | සංවර්ධන සහකාර |
| කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සුභාවිතයක් සඳහා සේවා විශිෂ්ටතා සැලැස්ම සම්බන්ධ වැඩමුළුව | තායිලන්තය | කේ.ඒ.ඩී.එස්.කුලතුංග මයා | සංවර්ධන සහකාර |
| කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සුභාවිතයක් සඳහා සේවා විශිෂ්ටතා සැලැස්ම සම්බන්ධ වැඩමුළුව | තායිලන්තය | ඒ.එච්.ඩී.අරංගල්ල මයා | සංවර්ධන සහකාර |
| හරිත ඵලදායිතාව පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම | මැලේසියාව | ඩබ්.එම්.සුරංග අමරජීව මයා | සංවර්ධන සහකාර |
| හරිත ඵලදායිතාව පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම | මැලේසියාව | ජී.ඊ.ඩී.ආර්.මුදියන්සේ මිය | සංවර්ධන සහකාර |
| ඵලදායිතා වෘත්තිකයන් සංවර්ධනය කිරීමේ පුහුණු පාඨමාලාව | පිලිපීනය | කේ.නාගසිංහ මයා | සංවර්ධන සහකාර |
| ආසියානු ඵලදායිතා සංවිධානයේ නියෝජිතයින් සඳහා උපාය මාර්ගික සැලසුම් පිළිබඳ වැඩමුළුව | ජපානය | ඩබ්.එම්.ඩී.සුරංග ගුණරත්න මයා | අධ්‍යක්‍ෂ, ජා.එ.ලේ කාර්යාලය |
| සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධන නිපුණත්වය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව | කොරියාව | බී.ඒ.ඒ.ඩී.සුභසිංහ මයා | සහකාර අධ්‍යක්ෂ |
| සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා කාර්මික ඉංජිනේරු තාක්‍ෂණය පිළිබඳ පුහුණු පාඨමාලාව | තායිපේ - චීනය | ආර්.එම්.අශෝක පෙරේරා මයා | සංවර්ධන සහකාර |
| සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා පූර්ණ තත්ත්ව කළමනාකරණය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම | ඉන්දුනීසියාව | කේ.ආර්.කේ.කංකානම්ගේ මයා | සංවර්ධන සහකාර |
| සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා LEAN නිමැවුම් ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම පිළිබඳ බහුපාර්ශවික නිරීක්‍ෂණ අධ්‍යයන කිරීම | මැලේසියාව | ඒ.ඩී.වයි.ආනන්දනී මිය | සහකාර අධ්‍යක්‍ෂ |
| සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනය පිළිබඳ බහුපාර්ශවික නිරීක්‍ෂණ අධ්‍යයන සභාව | තායිපේ - චීනය | ඩී.එම්.එච්.සමරසිංහ මයා | සංවර්ධන සහකාර |
| ආසියානු පැසිපික් කලාපයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ජාලය සංවර්ධනය පිළිබඳ බහුපාර්ශවික නිරීක්‍ෂණ අධ්‍යයන සභාව | තායිපේ - චීනය | ටී.එස්.එන්.ප්‍රනාන්දු මයා | සංවර්ධන සහකාර |
| ආසියානු පැසිපික් කලාපයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ජාලය සංවර්ධනය පිළිබඳ බහුපාර්ශවික නිරීක්‍ෂණ අධ්‍යයන සභාව | තායිපේ - චීනය | ඊ.සී.අමරසිංහ මිය | සංවර්ධන සහකාර |

| | | | |
|---|---|---|---|
| සාමාජීය නොවන රටවල ජාතික ඵලදායිතා ආයතනවල ව්‍යාපාර හා සේවා මොඩලයන් පිළිබඳ අධ්‍යයන වැඩසටහන | ඇමරිකා එක්සත් ජනපදය | ඩබ්ලිව්.එම්.ආර්.පී. වීරසිංහ මයා | අතිරේක ලේකම් |
| ආසියානු පාරිසරික හා ආර්ථික සැසිය | ජපානය | පී.එදිරිසිංහ මහත්මිය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් |
| ආසියානු පාරිසරික හා ආර්ථික සැසිය | ජපානය | බී.ජී.අයි.අයිරාංගනී මහත්මිය | ප්‍රධාන ගණකාධිකාරි |
| රාජ්‍ය අංශය සඳහා තත්ත්ව සම්මාන වැඩමුළුව | සිංගප්පූරුව | ඩී.එම්.ජී.මෙබලා දිලන්ති මිය | සංවර්ධන සහකාර |
| රාජ්‍ය අංශය සඳහා තත්ත්ව සම්මාන වැඩමුළුව | සිංගප්පූරුව | ආර්.එම්.ගාමිණි පියදාස මයා | සංවර්ධන සහකාර |
| තුන්වන ලෝකයේ හරිත ඵලදායිතාව පිළිබඳ සමුළුව | චීනය | ටී.එච්.බී.ඒ.දේශප්‍රිය මයා | සහාකාර අධ්‍යක්ෂ |
| ඵලදායිතා නියුක්තයන් සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන ( උසස් පාඨමාලාව) | මැලේසියා | පී.ඩබ්.කේ.ජේ.රංජිත් ප්‍රේමසිරි මයා | සංවර්ධන සහකාර |
| සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල නව ආහාර නිෂ්පාදනය කිරීමේ තාක්ෂණය පිළිබඳ වැඩමුළුව | සිංගප්පූරුව | එම්.රංග තුෂාර මයා | සංවර්ධන නිලධාරි |
| ජාත්‍යන්තර හරිත ඵලදායිතා සංවර්ධන වැඩමුළුව | ජපානය | ඩබ්.එම්.සුරංග ගුණරත්න මයා | අධ්‍යක්ෂ |
| ජාතික ඵලදායිතා ආයතන පිළිබඳ පර්යේෂණ හා විශ්ලේෂණ වැඩසටහන | වියට්නාමය | ටී.එස්.එන්.ප්‍රනාන්දු මිය | සංවර්ධන සහකාර |




## විශේෂ වැඩසටහන්

2014 වසරේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පැවති දැයට කිරුළ සංවර්ධන වැඩසටහනට සමගාමී ව මෙම අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති ආයතන විසින් විවිධ වැඩසටහන් පවත්වන ලදී.

ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් විවිධ ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය, පාසැල් අංශය හා ප්‍රජාව ඉලක්ක කරගෙන පවත්වන ලදී. විරැකියාව අවම කිරීම අරමුණු කරගෙන මිනිස්බල හා රැකීරක්‍ෂා දෙපාර්තමේන්තුව විසින් ස්වයං රැකියා පුහුණු වැඩසටහන්, රැකියාගත කිරීමේ වැඩසටහන් ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් පවත්වන ලදී. එසේම මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද පුහුණු වැඩසටහන්වලට සහභාගීවූවන්ට සහතිකපත් ප්‍රදානය හා උපකරණ බෙදාදීම දැයට කිරුළ ප්‍රදර්ශන භූමියේ දී සිදුකරන ලදී.




ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය විසින් නිර්මාණය කරන ලද ප්‍රදර්ශන කුටිය මගින් අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවල ක්‍රියාකාරකම් පිළිබඳ ව තොරතුරු ප්‍රදර්ශනය කරන ලදී. එසේම මහජනතාව සහ පාසල් සිසුන් ඉලක්ක කරගෙන ඵලදායිතා සංකල්ප පිළිබඳ තොරතුරු ලබාදීම හා මිනිස්බල හා රැකීරක්‍ෂා දෙපාර්තමේන්තුවේ තොරතුරු ලබාදීම කෙරෙහි වැඩි අවධානයක් යොමුකරන ලදී. ප්‍රදර්ශන කුටිය නැරඹීම සඳහා විශාල පිරිසක් පැමිණීම විශේෂත්වයකි.



ප්‍රදර්ශන කුටිය නැරඹීමට පැමිණි පිරිස



ස්වයං ව්‍යවසායකයින් සඳහා සහතික පත්‍ර ප්‍රධානය කිරීම





## අභ්‍යන්තර විගණන ක්‍රමවේදය ශක්තිමත් කිරීම

### අභ්‍යන්තර විගණන අංශය හා විගණන කළමනාකරණ කමිටුව

අභ්‍යන්තර විගණන අංශය අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති ආයතනවල කටයුතු රජයේ ක්‍රමානුකූල හා විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ සිය අරමුණු ඉටුකර ගැනීම සඳහා සහාය වේ. ආයතනයේ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ අභ්‍යන්තර පාලනයක් සහ අභ්‍යන්තර විගණනය හරහා සිදු වේ.

2014 වසර තුළ දී අමාත්‍යාංශයේ සහ ඒ යටතේ ඇති ආයතනවල අභ්‍යන්තර විගණන අංශය අඛණ්ඩ විගණන කටයුතුවල නිරත වූ අතර, විගණනය මඟින් හඳුනා ගන්නා ලද අඩුපාඩු හා වැරදි නිවැරදි කිරීමට පියවර ගෙන ඇත.

විගණන හා කළමනාකරණ රැස්වීම් 03 ක් අමාත්‍යාංශය හා අනෙකුත් ආයතනවල සහභාගීත්වයෙන් 2014 වර්ෂය තුළ පවත්වන ලදී.







## ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශයේ 2014.12.31 දිනට

## වියදම් සාරාංශය (රු.මිලියන)

| | 2014 ඇස්තමේන්තුගත මුදල | 2014.12.31 දිනට වියදම | මුල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම | **424.2** | **410.3** | **96.7%** |
| ප්‍රාග්ධන වියදම | **106.1** | **58.7** | **55.3%** |
| මුළු වියදම | **530.3** | **469.0** | **88.4%** |



# 2014.12.31 දිනට පුනරාවර්තන වියදම් සාරාංශය

| වැඩ සටහන | ව්‍යාපෘතියේ නම | අයවැය ඇස්තමේන්තු මගින් වෙන් කරන ලද මුදල (රු) | ශුද්ධ ප්‍රතිපාදන (රු) | මුළු වියදම (රු) | ශුද්ධ ඉතිරිය / අතිරික්තය (රු) |
|---|---|---|---|---|---|
| 01 මෙහෙයුම් වැඩසටහන | **ව්‍යාපෘති අංක 01** <br> **අමාත්‍ය කාර්යාලය** | | | | |
| | පුද්ගල පඩිනඩි | 10,100,000 | 10,000,000 | 9,404,102 | 595,898 |
| | වෙනත් වියදම් | 31,600,000 | 27,450,000 | 24,458,127 | 2,991,873 |
| | උප එකතුව | **41,700,000** | **37,450,000** | **33,862,229** | **3,587,771** |
| | **ව්‍යාපෘති අංක 02** <br> පරිපාලන හා ආයතන සේවා | | | | |
| | පුද්ගල පඩිනඩි | 18,200,000 | 17,500,000 | 16,455,830 | 1,044,170 |
| | වෙනත් වියදම් | 76,500,000 | 78,860,000 | 75,508,356 | 3,351,644 |
| | උප එකතුව | **94,700,000** | **96,360,000** | **91,964,186** | **4,365,814** |
| | **මුළු එකතුව** | **136,400,000** | **133,810,000** | **125,826,415** | **7,983,585** |
| 02 සංවර්ධන වැඩසටහන | **ව්‍යාපෘති අංක 03** <br> **ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය** | | | | |
| | **පුද්ගල පඩිනඩි** | 220,900,000 | 232,090,000 | 228,124,060 | 3,965,940 |
| | **වෙනත් වියදම්** | 66,900,000 | 58,300,000 | 56,314,901 | 1,985,099 |
| | **මුළු එකතුව** | **287,800,000** | **290,390,000** | **284,443,961** | **5,951,039** |

# 2014.12.31 දිනට ප්‍රාග්ධන වියදම් සාරාංශය

වැඩසටහන : 01 - මෙහෙයුම් වැඩසටහන

ව්‍යාපෘතිය : 01 - අමාත්‍ය කාර්යාලය

| වැය ශීර්ෂය | අයිතමය | මූලාශ්‍රය | අයිතමයේ නම | අයවැය ඇස්තමේන්තු මඟින් වෙන් කරන ලද මුදල (රු) | ශුද්ධ වෙන් කිරීම (රු) | මුළු වියදම (රු) | ශුද්ධ ඉතිරිය / අතිරික්තය (රු) |
|---|---|---|---|---|---|---|---|
| | | | **ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම** | | | | |
| 2001 | | 11 | ගොඩනැගිලි ඉදිකිරීම් | 500,000 | 500,000 | 75,199 | 424,801 |
| 2002 | | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 500,000 | 500,000 | 261,000 | 239,000 |
| 2003 | | 11 | වාහන | 500,000 | 500,000 | 436,307 | 63,693 |
| | | | **ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම්** | | | | |
| 2101 | | 11 | වාහන | 40,000,000 | 40,000,000 | - | 40,000,000 |
| 2102 | | 11 | ලීබඩු හා කාර්යාල උපකරණ | 1,000,000 | 1,000,000 | 1,000,000 | - |
| 2103 | | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 800,000 | 800,000 | 800,000 | - |
| | | | **එකතුව** | **43,300,000** | **43,300.000** | **2,572,506** | **40,727,494** |

වැඩසටහන : 01 - මෙහෙයුම් වැඩසටහන

ව්‍යාපෘතිය : 02 - පරිපාලන හා ආයතන සේවා

| වැය ශීර්ෂය | අයිතමය | මූලාශ්‍රය | අයිතමයේ නම | අයවැය ඇස්තමේන්තු මඟින් වෙන් කරන ලද (රු) | ශුද්ධ වෙන් කිරීම (රු) | මුළු වියදම (රු) | ශුද්ධ ඉතිරිය/ අතිරික්තය (රු) |
|---|---|---|---|---|---|---|---|
| | | | **ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම** | | | | |
| 2001 | | 11 | ගොඩනැගිලි ඉදිකිරීම් | 10,000,000 | 10,000,000 | 4,403,243 | 5,596,757 |
| 2002 | | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 1,000,000 | 1,000,000 | 783,903 | 216,097 |
| 2003 | | 11 | වාහන | 1,000,000 | 1,000,000 | 935,089 | 64,911 |
| | | | **ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම්** | | | | |
| 2101 | | 11 | වාහන | 8,040,000 | 6,592,000 | 6,591,712 | 288 |
| 2102 | | 11 | ලී බඩු හා කාර්යාල උපකරණ | 4,000,000 | 4,000,000 | 4,000,000 | - |
| 2103 | | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 5,00,000 | 5,00,000 | 493,803 | 6,197 |
| | | | **මානව සම්පත් සංවර්ධනය** | | | | |
| | | | | | | | |
| 2401 | | 11 | පුහුණු හා හැකියා වර්ධනය | 900,000 | 900,000 | 882,593 | 17,407 |
| | | | | | | | |
| 2502 | | 11 | වෙනත් - ආයෝජන | 1,200,000 | 1,200,000 | 1,200,000 | - |
| | | | **එකතුව** | **26,640,000** | **25,192,000** | **19,290,343** | **5,901,657** |

වැඩසටහන : 02 - සංවර්ධන වැඩසටහන

ව්‍යාපෘතිය : 03 - ජාතික එලදායිතා ලේකම් කාර්යාලය

| වැය විෂය | අයිතමය | මූලාශ්‍රය | අයිතමයේ නම | අයවැය ඇස්තමේන්තු මගින් වෙන් කරන ලද (රු) | ශුද්ධ වෙන් කිරීම (රු) | මුළු වියදම (රු) | ශුද්ධ ඉතිරිය/ අතිරික්තය (රු) |
|---|---|---|---|---|---|---|---|
| | | | **ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම** | | | | |
| 2001 | | 11 | ගොඩනැගිලි ඉදිකිරීම් | 500,000 | 500,000 | 391,271 | 108,729 |
| 2002 | | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 200,000 | 200,000 | 191,024 | 8,976 |
| 2003 | | 11 | වාහන | 500,000 | 500,000 | 415,896 | 84,104 |
| | | | **ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම්** | | | | |
| 2102 | | 11 | ලී බඩු හා කාර්යාල උපකරණ | 1,000,000 | 1,000,000 | 1,000,000 | - |
| 2103 | | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 1,000,000 | 1,000,000 | 1,000,000 | - |
| | | | මානව සම්පත් සංවර්ධනය | | | | |
| 2401 | | 11 | පුහුණු හා ධාරිතා සංවර්ධනය | 11,000,000 | 12,448,006 | 11,907,488 | 540,512 |
| | | | | | | | |
| 2502 | | 11 | ආයෝජන | 2,000,000 | 2,000,000 | 1,953,988 | 46,012 |
| 2401 | | 11 | පුහුණු හා ධාරිතා සංවර්ධනය | 20,000,000 | 20,000,000 | 19,981,964 | 18,036 |
| | | | **එකතුව** | **36,200,000** | **37,648,000** | **36,841,631** | **806,369** |

# රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම

| අත්තිකාරම් ගිණුම | උපරිම හර සීමාව (රු) | අවම බැර සීමාව (රු) | උපරිම හර සීමාව (රු) |
|---|---|---|---|
| විසර්ජන පනත මගින් අනුමත සීමාව | 7,500,000 | 1,300,000 | 28,000,000 |
| සංශෝධිත සීමාව | 7,500,000 | 1,300,000 | 28,000,000 |
| සත්‍ය අගයන් | | | |
| 181011 | 5,844,566 | 3,208,284 | 15,599,062 |
| 181012 | 3,056,358 | 5,247,668 | |
| **එකතුව** | **8,900,924** | **8,455,952** | **15,599,062** |

# පොදු තැන්පත් ගිණුම - **2014**

| නම | ගිණුම් අංකය | **2014/01/01** දිනට ආරම්භක ශේෂය | වර්ෂය තුල හර කිරීම් | වර්ෂය තුල බැර කිරීම් | **2014/12/31** දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| පොදු තැන්පත් ගිණුම | **6000/0000/0015/0181** | **3,252,137.15** | **14,721,170.23** | **17,421,877.37** | **5,952,844.29** |

# ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය

ශ්‍රී ලංකාව 1966 වසරේ ආසියානු ඵලදායිතා සංවිධානයේ සාමාජිකත්වය ලබාගත් අතර එතැන් පටන් රටේ ඵලදායිතාව ඉහළ නැංවීම උදෙසා විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී. එසේම 1997-2006 දශකය ඵලදායිතා දශකය ලෙස නම් කරන ලද අතර 2002 වසරේ දී ඉතිහාසයේ සුවිශේෂී මහ සලකුණක් සටහන් කරමින් රාජ්‍ය හා පෞද්ගලික යන අංශ දෙක සඳහා ජාතික ඵලදායිතා ප්‍රතිපත්තිය හඳුන්වා දෙන ලදී. මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය කම්කරු අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කරන ලදී. එවකට පැවති කම්කරු සබඳතා සහ විදේශ රැකියා අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ රාජ්‍ය, පෞද්ගලික, පාසල් සහ ප්‍රජා යන අංශ හතර ඔස්සේ ඵලදායිතා ප්‍රවර්ධන දැනුවත් කිරීමේ වැඩ සටහන්, සම්මාන ප්‍රදානෝත්සව, තරඟාවලි, ආදර්ශ සමාගම් ගොඩනැඟීම, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් නඟා සිටුවීම ආදී වැඩසටහන් දීප ව්‍යාප්ත මට්ටමින් ක්‍රියාත්මක කරන ලදී. ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය 2010 වර්ෂයේ දී ස්ථාපිත කරන ලද අතර ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයද එම අමාත්‍යාංශය යටතට ගනු ලැබිය .


ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය වර්ෂ 2020 වන විට සැමට ඵලදායිතාව" යන අරමුණ ළඟා කර ගැනීම සඳහා ආසියානු ඵලදායිතා සංවිධානයේ සහ එහි සාමාජික රටවල ද සහයෝගය ඇතිව ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව 2014 දි ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පහත ප්‍රධාන අංශ යටතේ දැක්විය හැක.

1. ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන්
2. ඵලදායිතා පුහුණුව සහ ධාරිතා සංවර්ධනය
3. ඵලදායිතා සම්මාන තරඟාවලිය සහ සම්මාන ප්‍රදානය
4. ආසියානු ඵලදායිතා සංවිධානයේ සම්බන්ධීකරණ කටයුතු
5. ඵලදායිතාවය සම්බන්ධ ප්‍රචාරණ කටයුතු

එම සියලු වැඩසටහන් සඳහා ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ 2014 වර්ෂය තුළ වියදම් සාරාංශය පහත දැක්වේ.


## ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය 2014.12.31 දිනට වියදම් සාරාංශය (රු.මිලියන)

| | 2014 ඇස්තමේන්තුගත මුදල (රු.මි ) | 2014.12.31 දිනට වියදම (රු.මි ) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම | **290.4** | **284.4** | **97.9** |
| ප්‍රාග්ධන වියදම | **37.6** | **36.8** | **97.8** |
| මුළු වියදම | **328.0** | **321.2** | **97.9** |




## 1.ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන්

ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය මගින් සිදු කරනු ලබන ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් ප්‍රධාන වශයෙන් පහත සදහන් අංශ ඉලක්ක කරගෙන පවත්වනු ලැබේ. මෙම වැඩසටහන් දැනුවත් කිරීම්, විශේෂ ව්‍යාපෘති, උපදේශන සේවා ලෙස ක්‍රියාත්මක කරනු ලැබේ. එසේම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් අනුයුක්ත කර ඇති ඵලදායිතා නිලධාරීන් මඟින් දිවයිනේ සියලු ප්‍රදේශ ආවරණය කරනු ලැබේ.



2014 වර්ෂය තුළ ඵලදායිතා ප්‍රවර්ධනය සඳහා අධ්‍යාපන, රාජ්‍ය, පුද්ගලික සහ ප්‍රජා අංශවල පවත්වන ලද වැඩසටහන්වල භෞතික ප්‍රගතිය පහත පරිදි වේ.

| අංශය | ආයතන | ආයතන සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| අධ්‍යාපන අංශය | පෙර පාසල් | 1000 | 1776 |
| | පාසල් | 600 | 1405 |
| | උසස් අධ්‍යාපන සහ වෘත්තිය පුහුණු ආයතන | 10 | 50 |
| රාජ්‍ය අංශය | අමාත්‍යාංශ | 20 | 35 |
| | දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ආයතන | 600 | 1509 |
| පුද්ගලික අංශය | සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත | 500 | 512 |
| ප්‍රජා අංශය | ගම්මාන | 600 | 834 |
| | සාමාජිකත්වය මත පදනම් වූ ආයතන | 175 | 181 |
| | පාර්ශවකරුවන් | 150 | 169 |

## 1.1 අධ්‍යාපන අංශය තුළ පවත්වන ලද ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන්

අධ්‍යාපන අංශයේ ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ද සම්බන්ධ කර ගනිමින් අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාල සියළු ආයතන වල සිදු කරනු ලැබේ. 2014 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘති ලෙස අධ්‍යාපන අමාත්‍යාංශයේ කලාප කාර්යාල ඵලදායිතා සංකල්ප වලින් සන්නද්ධ කරනු ලබන ව්‍යාපෘතිය සහ විද්‍යාපීඨ ගුරුවරුන් තුළ ඵලදායිතා දැනුම වර්ධනය කිරීම සඳහා සිදුකරනු ලබන ඉසුරු ගුරු ව්‍යාපෘතිය දැක්විය හැක. 2014 වර්ෂය තුළ කලාප කාර්යාල 6 ක ඵලදායිතා සංකල්ප ක්‍රියාත්මක වීම අරඹා ඇත. එසේම ඉසුරු ගුරු ව්‍යාපෘතිය මගින් විද්‍යාපීඨ 18 ක ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් පවත්වා ගුරුවරුන් 7214 ක් දැනුවත්කර ඇත.





ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ ඉහළ කළමනාකාරිත්වය සඳහා ඵලදායිතා වැඩසටහන



හාපිටිගම ගුරු අධ්‍යාපන විද්‍යා පීඨය ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන

එසේම අධ්‍යාපන අංශයේ ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් පෙර පාසැල් , පාසැල් හා උසස් අධ්‍යාපන ආයතන වල සිදුකරනු ලැබේ. මේ මගින් නිර්මාණශීලීත්වය, නවෝත්පාදනය හා වෙනස් විධියට සිතීමේ හැකියාව සිසුන් තුළ වර්ධනය කිරීමට අවශ්‍ය පසුබිම සකස් කරනු ලැබේ. පුද්ගලයෙකු ඵලදායී වැඩිහිටියෙකු වීමට නම් ඔහු දැනුම, ආකල්ප සහ කුසලතාවයෙන් පිරිපුන් පරිණත පුද්ගලයෙකු විය යුතුවාක් මෙන්ම ඉහළ ගුණත්වයෙන් හෙබි ගුණගරුක අයෙකු බවට පත්වීමද අත්‍යවශ්‍ය වේ. එවැනි පුරවැසියෙකුට රටක සංවර්ධනයට නිසිදායකත්වය ලබාදිය හැකි වෙන අතරම සමාජ අභිවෘද්ධිය වෙනුවෙන් යහපත් පරපුරක් ගොඩනැගීමේ හැකියාවද නිරන්තරයෙන්ම හිමිවේ. මේ අනුව අධ්‍යාපන අංශයේ ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් වල අවසාන අරමුණ වන්නේ ස්වශක්තියෙන් නැගී සිටින නිර්මාණශීලී චින්තනයෙන් හෙබි ඵලදායී පුරවැසියන් ශ්‍රම බලකායට එකතු කිරීමයි.

## 1.1.1 පෙරපාසල් සඳහා ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන්







*පිබිදෙන මල් කැකුළු .........*

පෙර පාසල් සඳහා ඵලදායිතා සංකල්ප හඳුන්වා දීමේ වැඩසටහනක් 2013 වසරේදී ආරම්භ කරන ලදි. දිස්ත්‍රික් 16 ක පෙර පාසල් ගුරුවරුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා පෙර පාසල් ගුරුවරුන් 2158 ක් පුහුණු කර ඇත. 2014 වර්ෂයේදී පෙර පාසැල් 1776 ක ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.
එසේම මාතර දිස්ත්‍රික්කයේ පෙර පාසැල් 237 ක සහභාගිත්වයෙන් පෙර පාසල් අතර දිස්ත්‍රික් ඵලදායිතා සම්මාන උළෙලක් පවත්වා පෙර පාසැල් 87 ක් ඵලදායිතා ක්‍රමවේද ක්‍රියාත්මක කරන පෙර පාසැල් වශයෙන් සහතික කර ඇත.







සහතික කරන ලද පෙර පාසල් වල සිදු කරන ලද නවෝත්පාදනයන්. (බ්‍රිලියන්ට් පෙර පාසල මාතර)


## 1.1.2 පාසල් අංශයේ ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන්



*විකසිත හෙට දිනට දැය දිනන පරපුරක් .........*







ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය දීප ව්‍යාප්ත පාසල් ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් පවත්වනු ලබයි. 2013 වසරේදී අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඵලදායිතා ප්‍රවර්ධන සම්පත්දායක සංචිත වැඩිකිරීම හා ඔවුන් පුහුණු කිරීම සඳහා වැඩි අවධානයක් දෙන ලදි. මේ අනුව සම්පත්දායකයන් 178 දෙනෙකු පුහුණු කර ඇත. 2014 වර්ෂයේ දී පාසැල් 1405 ක ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

තවද පාසල් ඵලදායිතා සංගම් පිහිටුවීමේ මූලික කටයුතු 2014 වර්ෂයේදී ආරම්භ කළ අතර එමගින් ඵලදායිතා සංකල්ප ළමුන් තුළ නිර්මාණාත්මක අයුරින් සාමූහිකව ක්‍රියාත්මක කිරීමට පෙළඹවීම අරඹා ඇත.










අනුරාධපුර දිස්ත්‍රික්කයේ පාසල්වල සිදු කරන ලද ඵලදායිතා වැඩසටහන් සහ වැඩි දියුණු කිරීම්

## 1.1.2 උසස් අධ්‍යාපන අංශයේ ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන්




*රටට හිතැති දැයට වැඩැති පුරවැසියන් .........*

2013 වසරේදී නව වැඩසටහනක් ලෙස විශ්ව විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සඳහා ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් ආරම්භ කරන ලදි. මේ යටතේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සඳහා වැඩසටහන් 02 ක් 2013 මැයි/ ජුනි මාසවලදී පවත්වන ලදි. 2014 වර්ෂයේදී වෘත්තිය තාක්ෂණ ආයතන 50 ක ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර රුහුණු විශ්ව විද්‍යාලය ජාතික ඵලදායිතා තරගාවලිය සඳහා ඉදිරිපත් වී ඵලදායිතා සම්මානයක් දිනා ගන්නා ලදී. රුහුණු විශ්වවිද්‍යාලය තුළ ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් තවදුරටත් පුළුල් කිරීම සඳහා ලේකම් තුමා එම විශ්ව විද්‍යාලයේ උපකුලපතිතුමන සමග සාකච්ඡාවක් පවත්වන ලදී.



රුහුණු විශ්ව විද්‍යාලයේ උපකුලපතිතුමන් සමග පැවති සාකච්ඡාව







**කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීම් දෙපාර්තමේන්තුවේ කරන ලද වැඩසටහනක්**

## 1.2 රාජ්‍ය අංශයේ ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන්









*"මහජන හිතකාමී විශිෂ්ට රාජ්‍ය සේවාවක්"*

ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය මේ දක්වා ඉහළ ප්‍රමුඛත්වයක් ලබා දී ඇත්තේ රාජ්‍ය අංශයේ ඵලදායිතාව ඉහළ නැංවීමටයි. මේ වන විට රාජ්‍ය ආයතන විශාල ප්‍රමාණයක් ඵලදායිතා සංකල්ප අනුගමනය කරමින් සිය සේවාවේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට උත්සාහ දරමින් සිටී. රටේ මහජනතාවට විශිෂ්ට සේවාවක් සැපයීම සඳහා මධ්‍යම රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලත්, පළාත් සභා අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලත්, මහජනතාවට ඉතා සමීප ආයතන වන දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලත්, පළාත් පාලන ආයතන වලත් ඵලදායිතා වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. ඵලදායිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ආයතන ප්‍රධානින්ගේ පූර්ණ අවධානය යොමුකර වීමට සහ රාජ්‍ය අංශයේ ඵලදායිතා ප්‍රවර්ධන කටයුතු විධිමත් කිරීම සඳහා ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමන් විසින් අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 51 ක් 2014 වර්ෂය තුළ පවත්වා ඇත.





| රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ පැවති මූලික සාකච්ඡාව | ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ පැවති මූලික සාකච්ඡාව |
|---|---|

## අමාත්‍යාංශ සඳහා ඵලදායිතා වැඩසටහන්

ඵලදායිතා අමාත්‍යාංශයේ ලේකම් සහ අමාත්‍යාංශ ලේකම්වරුන් අතර හමුවෙන් පසු අමාත්‍යාංශ වල සහ ඒවාට අනුබද්ධ ආයතන වල ඵලදායිතා වැඩසටහන් වඩා විධිමත්ව ක්‍රියාත්මක කරන ලදී 2014 වර්ෂයේදී විවිධ අමාත්‍යාංශ වල පවත්වන ලද ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් සංඛ්‍යාව 102 කි. රාජ්‍ය අංශයේ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ආයතන වල පවත්න ලද වැඩසටහන් සංඛ්‍යාව 1509 කි. මීට අමතරව පහත සඳහන් රාජ්‍ය ආයතන වල ඵලදායිතාවය නැංවීමේ විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කරණු ලබයි.

- ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව
- ලංකා බැංකුව
- ශ්‍රී ලංකා රේගුව
- මහජන බැංකුව ( ශාඛා 26 ක් - ගම්පහ)
- ග්‍රාමීය සංවර්ධන බැංකුව
- ජාතික ඉතිරි කිරීමේ බැංකුව
- කලාප අධ්‍යාපන කාර්යාල
- "ඉසුරුගුරු" ව්‍යාපෘතිය - ජාතික ගුරු විද්‍යාපීඨ සඳහා
- අධිකරණ වල විශේෂ ව්‍යාපෘති
- 2014 වර්ෂයේදී අමාත්‍යාංශවල පවත්වන ලද ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය

| | අමාත්‍යාංශය | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | අධිකරණ අමාත්‍යාංශය | 40 | 2243 |
| 2 | ධීවර අමාත්‍යාංශය | 9 | 894 |
| 3 | ළමා හා කාන්තා සංවර්ධන අමාත්‍යාංශය | 1 | 106 |
| 4 | දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 1 | 45 |
| 5 | අධ්‍යාපන අමාත්‍යාංශය | 1 | 75 |
| 6 | ජාතික ගුරු විද්‍යාපීඨ - ඉසුරු ගුරු ව්‍යාපෘතිය | 18 | 7214 |
| 7 | ජල සම්පාදන හා ජලා පවාහන අමාත්‍යාංශය | 2 | 118 |
| 8 | තාක්ෂණ පර්යේෂණ අමාත්‍යාංශය - කර්මාන්ත තාක්ෂණ ආයතනය | 1 | 40 |
| 9 | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය | 3 | 155 |
| 10 | සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 2 | 117 |
| එකතුව | | 102 | 3503 |

## අධිකරණ අමාත්‍යාංශයේ පැවැත්වූ වැඩසටහන් වල ප්‍රගතිය

අධිකරණ පද්ධතිය තුළ ඵලදායිතා සංකල්ප සහ 5S ක්‍රමවේද ක්‍රියාත්මක කිරීමෙන් රාජ්‍ය අංශයේ ඵලදයිතාව පිළිබඳ ජනතාව තුළ සුභවාදී ආකල්ප ජනනය වනු ඇති බව ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය අපේක්ෂා කරයි.








**අධිකරණ අමාත්‍යාංශයේ ඵලදායිතා සංකල්ප පිළිබඳ පැවැත්වූ වැඩසටහන්වලින් පසු සිදු කරන ලද වෙනස්කම්- කුලියාපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ පහසුවෙන් ලිපිගොනු හඳුනාගත හැකි පරිදි සකස් කර ඇති අයුරු**

## ප්‍රාදේශීයව ඇති රාජ්‍ය ආයතන වල වැඩසටහන්

රාජ්‍ය අංශයේ ආයතන 1509 ක් ආවරණය කරමින් 2014 වර්ෂයේ ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් සිදු කර ඇත. විශේෂයෙන් 2014 වර්ෂය තුල දමිළ මාධ්‍යයෙන් ද යාපනය කිලිනොච්චි වවුනියා වැනි දිස්ත්‍රික්ක වල ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වින.





**කයිසෙන් වැඩසටහන - ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය යාපනය**

රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාවය නැංවීමට නව පද්ධති සහ වැඩ ක්‍රම මෙන්ම කාර්යාලීය පරිසරය ප්‍රියමනාපව පැවතීමද ඉතා වැදගත්වේ. ඒ සඳහා ඵලදායිතා සංකල්ප වැදගත් මෙවලමකි. ඵලදායිතා වැඩසටහන් මගින් ජනනය වූ එවැනි යහපත් වෙනස්කම් ඉතා කුඩා වුවද විශාල බලපෑමක් ඇති කරයි.









වාරිමාර්ග දෙපාර්තමේන්තුව තුල සිදුකරන ලද වැඩි දියුණු කිරීම්

## 1.1.3 පෞද්ගලික අංශය ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන්



***“නිෂ්පාදන අංශයේ ඵලදායිතාවයට සවිමත් අත්වැලක්”***




පෞද්ගලික අංශයේ ඵලදායිතා ප්‍රවර්ධනයේ ප්‍රධාන වැඩසටහන වනුයේ කයිසෙන් ව්‍යාපෘතිය යි. එමගින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වල ද සමස්ථ පෞද්ගලික අංශයේම ඵලදායිතාවය නැංවීම සඳහා වැඩි අවධානයක් යොමු කර ඇත. කයිසෙන් ව්‍යාපෘතිය 2010 මාර්තු 27 දින නියමු ව්‍යාපෘතියක් ලෙස ගම්පහ දිස්ත්‍රික්කයෙන් ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය තුළ කයිසෙන්, හරිත ඵලදායිතාවය, තත්ත්ව කව වැනි විවිධ ඵලදායිතා සංකල්ප හඳුන්වා දෙන ලදී . එසේම සෑම ආයතනයකම ක්‍රියාවලි වැඩිදියුණු කිරිම සඳහා වැඩි අවධානයක් යොමු කරන ලදී.

2013 වර්ෂයේ දී ගම්පහ දිස්ත්‍රික්කයේ දෙවන අදියරත්, කළුතර, මහනුවර හා මාතර දිස්ත්‍රික්කවලත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ක්ෂේත්‍රය දියුණු කිරීම සඳහා මෙම වැඩසටහන යොදා ගන්නා ලදී. එසේම 5S, තත්ත්ව කව, හරිත ඵලදායිතා වැඩසටහන්වලට අමතරව මේ යටතේ මෙම ආයතනවල 2013 මාර්තු සිට 2014 මාර්තු දක්වා කයිසෙන් කළමනාකරු පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මෙම කයිසෙන් ව්‍යාපෘති හඳුන්වා දීම තුළින් පෞද්ගලික අංශයේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අත්කර ගැනීමට හැකි වී ඇති ජයග්‍රහණ පහත දක්වා ඇත.

ඉදිරි වර්ෂයේදී ශ්‍රී ලංකාවේ සියළුම දිස්ත්‍රික්කවල කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල කයිසෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය අපේක්ෂා කරයි.

කයිසෙන් ව්‍යාපෘතිය



දැනුවත් කිරීමේ වැඩසටහනක්



"සුචි" යෝගට් (පුද්ගලික) සමාගම - හරිත ඵලදායිතා සංකල්ප යොදාගැනීම.



"සුචි" යෝගට් (පුද්ගලික) සමාගම - ක්‍රියාවලි වැඩිදියුණු කිරීම තුලින් දිනක නිෂ්පාදන ධාරිතාව 2000 සිට 3000 දක්වා වැඩි වී ඇත.



ට්‍රයිටැක් ආයතනය




උදුම්බරා කේටර්ස්

**කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරිකයන්ගේ ජයග්‍රහණ**

| ආයතනයේ නම | ශ්‍රම බලකාය | | මාසික පිරිවැටුම | | නව ආයෝජන (මිලියන) |
|---|---|---|---|---|---|
| | මාර්තු **2010** | මාර්තු **2013** | මාර්තු **2010** | මාර්තු **2013** | **2012 - 2013** |
| කැන්ඩිඩ් ටෙක්නික්ස් | 8 | 25 | 0.5 | 3.0 | 8.0 |
| එස්කේ පොලිපැක් | 3 | 12 | 0.8 | 4.0 | 10.0 |
| මවුන්ට් පැක් | 50 | 120 | 7.0 | 15.0 | 500.0 |
| සිල්වර් ස්ටාර් පේන්ට් | 15 | 50 | 3.5 | 5.5 | 12.0 |
| වික්‍රම ආරච්චි ලැබ් | 25 | 35 | 1.2 | 3.5 | 12.0 |
| බුද්ධි ඉන්ඩස්ට්‍රීස් | 35 | 80 | 2.6 | 9.5 | 80.0 |
| හාවඩ් පැෂන් | 50 | 130 | 1.5 | 7.0 | 70.0 |
| රන්මෝ ප්ලාස්ටික් | 5 | 12 | 1.0 | 2.5 | 5.0 |
| දේදුනු බේකර්ස් | 18 | 25 | 2.8 | 3.5 | 6.0 |
| පොලිමර් ටෙක් | 20 | 40 | 3.0 | 4.0 | 25.0 |
| නිල් රෝස් ඇඩ්වටයිසින් | 12 | 15 | 1.5 | 3.8 | 6.0 |
| මැතැම්මාන | 12 | 15 | 0.65 | 0.8 | - |

**මහා පරිමාණ නිෂ්පාදන සේවා ආයතන වල ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් 19 ක් 2014 වර්ෂය තුල පවත්වා ඇත.**




**DFCC ආයතනයේ පවත්වන ලද වැඩසටහන**




**Modern Pack ආයතනයේ නිරීක්ෂණ අවස්ථාවක්**

## 1.1.5 ප්‍රජා ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන්







රටේ ඵලදායී සංස්කෘතියක් ස්ථාපිත කිරීම සඳහා ඉතා ඉහළ ප්‍රමුඛතාවයක් ලබාදිය යුත්තේ ගෘහස්ථ මට්ටමෙන් ඵලදායිතා සංකල්ප ව්‍යාප්ත කිරීම උදෙසාය. මෙම ඵලදායිතා සංකල්ප පිළිබඳ දැනුම ග්‍රාමීය ජනතාව වෙත ලබාදීම මගින් ඔවුන් තුළ ධනාත්මක ආකල්ප වර්ධනය, ගෘහස්ථ ආදායම වැඩිකර ගැනීම සඳහා විවිධ ක්‍රම හඳුන්වා දීම, ඉතිරිකිරීම් ප්‍රවර්ධනය මගින් ආයෝජන හැකියාව වැඩිකිරීම, කාල කළමනාකරණය පිළිබඳ ගෘහ ඒකක දැනුවත් කිරීමද මෙමගින් අපේක්ෂිතය. තම දැනුම හා හැකියාවද උපයෝගී කරගනිමින් ජීවන තත්ත්වය ඉහළ නංවා ගැනීමටත් , පවතින සම්පත්වලින් උපරිම ප්‍රයෝජනය සැපයීමද මෙම වැඩසටහන මගින් අපේක්ෂා කරයි. 2014 වර්ෂයේදී ගම්මාන 834 ක ප්‍රජා ඵලදායිතා වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති අතර සාමාජිකත්වය පදනම් කරගත් ගම් මට්ටමේ ස්වේච්ඡා සංවිධාන 181 සඳහා හා ගම් මට්ටමේ පාර්ශ්වකරුවන් 169 ක් සඳහා ද වැඩසටහන් මේ වන විට ක්‍රියාත්මක කර ඇත.





ප්‍රජා වැඩසටහන් - වව්නියාව








නිවෙස්වල ක්‍රියාත්මක කළ 5S වැඩසටහන් - බදුල්ල

## 2. ඵලදායිතා පුහුණුව සහ ධාරිතා සංවර්ධනය






**2.1** කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය වැඩි කිරීම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන්

ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයට **2013** වර්ෂයේ ඵලදායිතා සංවර්ධන නිලධාරීන් ලෙස බඳවා ගත් නවක නිලධාරීන් **643** ක් ඵලදායිතා සංවර්ධන පුහුණු කරුවන් ලෙස පුහුණු කිරීමට වැඩසටහන් පවත්වන ලදී.

නවක සංවර්ධන නිලධාරීන්ගේ පුහුණු වැඩසටහන්

| දිනය | වැඩසටහන | ස්ථානය | පුහුණු වූ සංඛ්‍යාව | වියදම |
|---|---|---|---|---|
| **2014.3.3-5** | මූලික ඵලදායිතා සංකල්ප | යන්ත්‍රෝපකරණ, ඉදිකිරීම් පුහුණු මධ්‍යස්ථානය | 51 | 254,624.00 |
| **2014.8.10** | මූලික ඵලදායිතා සංකල්ප | සර්වෝදය මධ්‍යස්ථානය ත්‍රිකුණාමලය | 32 | 214,873.00 |
| **2014.7.17 සිට 8.14** | මූලික ඵලදායිතා සංකල්ප | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය | 87 | 121,625.00 |





නවක සංවර්ධන නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන

## ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය

| පුහුණු වැඩසටහන | සහභාගී නිලධාරීන් ගණන | පවත්වන ලද ආයතනය | වියදම |
|---|---|---|---|
| ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව (මධ්‍යම මට්ටම) | 03 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 50 ,000.00 |
| මූලික සිංහල | 01 | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | 5,000.00 |
| දෙමළ | 01 | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | 5,000.00 |
| කාර්යාල ක්‍රම | 50 | ඵලදායිතා අමාත්‍යාංශය | 158,625.00 |
| එකතුව | | | 218625.00 |

## බාහිර ආයතන සඳහා පවත්වන ධාරිතා සංවර්ධන වැඩසටහන්

ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ බාහිර ආයතන සඳහා පවත්වනු ලබන ධාරිතා සංවර්ධන වැඩසටහන් ඵලදායිතා ඩිප්ලෝමා, සහතික පත්‍ර පාඨමාලාව , සහ කෙටි කාලීන පාඨමාලා ලෙස දැක්විය හැක. 2014 වර්ෂයේදී පවත්වනු ලැබූ පාඨමාලාවල විස්තර පහත දැක්වේ. මෙම පාඨමාලාවලින් උපයා ඇති ආදායම රුපියල් මිලියන 5.257 කි. මීට අමතරව සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා පූර්ණ තත්ත්ව කළමනාකරණ පුහුණු පාඨමාලා 02ක් පැවැත්වීමට හැකි විය. 2014 වර්ෂයේදී ඵලදායිතා ඩිප්ලෝමාව ආරම්භ කරන ලද අතර මෙමගින් ඵලදායිතාවය පිළිබඳ මූලික සංකල්ප මෙන්ම උසස් ඵලදායිතා සංකල්ප පිළිබඳ දැනුමද පුළුල්ව ලබා දේ. මෙහි විශේෂ මොඩියුල 2 ක් විදේශීය සම්පත් දායකයින් මගින් ආවරණය කරනු ලැබිණ. ඩිප්ලෝමා පාඨමාලාවේ සහභාගිත්වය 50 කි.






ඵලදායිතා ඩිප්ලෝමා පාඨමාලාව ප්‍රචාරක පත්‍රිකාව,සහ සමාරම්භක අවස්ථාව


## වෙනත් පුහුණු වැඩසටහන්

| වැඩසටහන් | පුහුණු වූ සංඛ්‍යාව | වියදම |
|---|---|---|
| පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන | 44 | 100,010.00 |
| සෞඛ්‍ය ක්ෂේත්‍රය පූර්ණ තත්ත්ව කළමනාකරණ සහතික පත්‍ර පාඨමාලාව (වැඩසටහන් 2) | 145 | 286,500.00 |

| පුහුණු පාඨමාලා | | | | | |
|---|---|---|---|---|---|
| | වැඩසටහන | කාලසීමාව | පාඨමාලාව ගාස්තු (රු) | සහභාගී වූ සංඛ්‍යාව | ආදායම (රු) |
| 1 | කෙටිකාලීන පාඨමාලා | | | | |
| | කයිසෙන් කළමනාකරණ | | 3000.00 | 62 | 186,000.00 |
| | කයිසෙන් යෝජනා | | 3000.00 | 43 | 129,000.00 |
| | හරිත ඵලදායිතාවය දැනුවත් කිරීමේ වැඩසටහන | | 3000.00 | 60 | 180,000.00 |
| | **3 R** ක්‍රමවේදය | | 3000.00 | 33 | 78,000.00 |
| | හරිත ඵලදායිතාවය වැඩමුළුව | | 6000.00 | 25 | 150000.00 |
| | තත්ත්ව කව | | 3000.00 | 66 | 198,000.00 |
| | තත්ත්ව කව නායකත්ව පුහුණුව | ජූනි 5,6 | 5000.00 | 41 | 205,000.00 |
| | දැනුම කළමනාකරණය | අප්‍රේල් 4 | 3000.00 | 37 | 111000.00 |
| | **(TPM)** පූර්ණ ඵලදායිතා නඩත්තුව | ජූලි 4 | 3000.00 | 57 | 171,000.00 |
| | වැඩ අධ්‍යනය | අප්‍රේල් 25 | 3000.00 | 15 | 45,000.00 |
| | වෙනස්වීම් කළමනාකරණය | මැයි 30 | 3000.00 | 47 | 141,000.00 |
| | නායකත්වය | අගෝ5 . | 3000.00 | 55 | 165,000.00 |
| | ඵලදායිතා මිනුම් විශ්ලේෂණය | මාර්තු 25 | 3000.00 | 99 | 297,000.00 |
| | මානව සම්පත් කළමනාකරණය | ජූනි 17 | 3000.00 | 36 | 108,000.00 |
| | තුලිත පාලන සමීකරණය | නොවැ 3 | 3000.00 | 41 | 1,23,000.00 |
| | කාර්යක්ෂමතාව බලශක්ති | දෙසැ 3 | 3000.00 | 25 | 75,000.00 |
| 2 | ඵලදායිතා සහතික පත්‍ර පාඨමාලා | | | | |
| | ඵලදායිතා සහතික පත්‍ර පාඨමාලා 1 | පෙබ 13දින 10 | 15000.00 | 67 | 1,005,000.00 |
| | ඵලදායිතා සහතික පත්‍ර පාඨමාලා 11 | සැප් 27 දින | 15000.00 | 26 | 390,000.00 |
| 3 | ඵලදායිතා ඩිප්ලෝමා පාඨමාලාව.රු **1,000,000.00**ක් ලැබිය යුතුයි | සැප්තැම්බර් 21 සිට වසර 1 | 50000.00 | 50 | 1,500,000.00 |
| | එකතුව | | | 892 | 5,257,000.00 |

## 2014 වසරේ දී ඒකාබද්ධ අරමුදලට බැර කළ ආදායම

| වර්ෂය | ආදායම රු.මි. |
|---|---|
| **2003** | 0.714 |
| **2004** | 1.895 |
| **2005** | 1.216 |
| **2006** | 1.685 |
| **2007** | 2.834 |
| **2008** | 3.683 |
| **2009** | 1.933 |
| **2010** | 4.443 |
| **2011** | 4.883 |
| **2012** | 6.965 |
| **2013** | 2.710 |
| **2014** | **8.257** |








කෙටි කාලීන පාඨමාලාව (තත්ත්වකව වැඩසටහන)








කෙටි කාලීන පාඨමාලාව - පූර්ණ තත්ත්ව කළමනාකරණය


කෙටි කාලීන පාඨමාලාව - හරිත ඵලයිතාවය

## 3 ජාතික ඵලදායිතා සම්මාන තරගාවලිය සහ සම්මාන ප්‍රදානය






ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය විවිධ වූ වැඩසටහන් මගින් රටේ විවිධ වූ සමාජ ස්ථර තුල ස්ථාපනය කරන ලද ඵලදායිතා සංකල්ප ක්‍රියාත්මක තලයට ගෙන ඒමෙන් සාර්ථකත්වයට පත් වූ ආයතන ඇගයීම ජාතික ඵලදායිතා සම්මාන තරඟාවලියෙන් සිදු කෙරේ. 1993 වසරේදී කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ සීමිත ආයතන සංඛ්‍යාවක් සහභාගි කරවා ගෙන ආරම්භ කරන ලද මෙම තරඟාවලිය අද වන විට පාසල්, රාජ්‍යය, පෞද්ගලික යන රටේ සියළු අංශ නියෝජනය කරන ආයතන සහභාගිත්වයෙන් පවත්වනු ලබයි. ජාතික ඵලදායිතා සම්මාන තරඟාවලිය සඳහා ආයතන 1376 ක් ඉදිරිපත් වී ඇති අතර එයින් ලැබූ ආදායම රු. මිලියන 3 ක් වේ.

මෙම සම්මාන තරඟාවලියේ විනිශ්චය කටයුතු ඵලදායිතා සංකල්ප සහ ආයතන පරිපාලනයේ හසල දැනුමක් ඇති විද්වත් විනිශ්චය මණ්ඩලයක් මගින් සිදුකරනු ලබයි.

මෙම සම්මාන තරඟාවලියේ විවිධ අංශ නියෝජනය කරමින් පළමු ස්ථානයට පත් වූ ආයතන සිදු කර ඇති නව්‍යකරණයන් අනෙකුත් ආයතනවල ඵලදායිතාව ඉහළ නැංවීමට විශිෂ්ට අත්දැකීම ලෙස උපයෝගී කර ගනු ලබයි.

ආයතනික භෞතික පරිසරය සකස් කිරීම, වඩා පහසු ඵලදායී ක්‍රියාමාර්ග හඳුනා ගැනීම, උසස් ගුණාත්මක සේවාවන් සහිත නිෂ්පාදනයක් ලබා දීම සහ සේවක තෘප්තිය යන අංශ වලින් ආයතනවල අරමුණු කරා ළඟා වීමෙන් සමස්ථ ජාතියේ ඵලදායිතාව ඉහළ නැංවීමට ඉවහල් වේ.

2012/2013 ජාතික ඵලදායිතා සම්මාන උළෙල සඳහා පැවැත් වූ මූලික ක්‍රියාකාරකම් වනුයේ උපදෙස් සහ ඇගයීමේ ක්‍රියාවලිය පැහැදිලි කිරීමේ වැඩසටහන් දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වීම, අයදුම්පත් කැඳවීම,මූලික පොත් පරීක්ෂාව (Desktop Evaluation), ක්ෂේත්‍ර පරීක්ෂාව,ජාතික ඵලදායිතා සම්මාන උළෙල පැවැත්වීම.මේ සඳහා වැයවූ මුදල මිලියන 16.4 කි.

**ජාතික ඵලදායිතා සම්මාන උළෙල පැවැත්වීම.**

මෙවර, එනම් 2012/2013 ජාතික ඵලදායිතා සම්මාන ප්‍රදානෝත්සවය ගරු ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ හා ගරු ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍ය බෂීර් සේගුදාවූද් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සැප්තැම්බර් 04 වන දින බන්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විනි. මෙහි දී ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන ලැබූ ආයතන එදින සම්මානයෙන් පිදුම් ලබන ලදී. විශේෂ කුසලතා සම්මාන සහ කුසලතා සම්මාන ලද ආයතන 304 ක් සඳහා පළාත් සම්මාන උළෙලක් සෙත්සිරිපාය පොදු ශ්‍රවනාගාරයේදී පවත්වන ලදී.

ජාතික ඵලදායිතා සම්මාන උළෙලේ පළමු ස්ථානය ලැබූ ජයග්‍රාහකයින්

- අ. ර / සීවලී මධ්‍ය මහා විද්‍යාලය, රත්නපුර
- ආ. ර/ හිග්ගස්වත්ත ප්‍රාථමික විදුහල, කුරුවිට
- ඇ. සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, මධ්‍යම පළාත
- ඈ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, බුත්තල
- ඉ. පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව
- ඊ. උකුවෙල විදුලි බලාගාරය





රාජ්‍ය අංශය පළමු ස්ථානය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, බුත්තල

සේවා අංශය පළමු ස්ථානය උකුවෙල විදුලි බලාගාරය

## ජයග්‍රාහී ආයතන වල නව්‍යකරණයන්




හිග්ගස්වත්ත ප්‍රාථමික විද්‍යාලයේ ඉදිරිපස පෙනුම




හිග්ගස්වත්ත ප්‍රාථමික විද්‍යාලය සඳහා දෙමාපිය දායකත්වය






2006 සිට 2012/2013 ඵලදායිතා සම්මාන උළෙල දක්වා ආයතන ඉදිරිපත් වීම




| Total | 824 | 1324 | 1040 | 1017 | 811 | 1376 |
|---|---|---|---|---|---|---|

**2012/2013 ජාතික ඵලදායිතා සම්මාන ලාභීන්-502**

| අංශය | ජයග්‍රාහී ආයතන සංඛ්‍යාව | | | | | |
|---|---|---|---|---|---|---|
| | **1** | **2** | **3** | **SC** | **C** | එකතුව |
| රාජ්‍ය | 3 | 50 | 87 | 112 | 79 | 331 |
| පාසල් | 2 | 9 | 24 | 32 | 36 | 103 |
| පුද්ගලික | 1 | 9 | 13 | 30 | 15 | 68 |



**SC-විශේෂ කුසලතා C-කුසලතා**

## 4 ආසියානු ඵලදායිතා සංවිධානය හා සම්බන්ධීකරණ කටයුතු (APO)

ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ කටයුතු ආසියානු ඵලදායිතා සංවිධානය හා සම්බන්ධ වේ. ජපානය පාදක කරගෙන පිහිටුවා ඇති ආසියානු ඵලදායිතා සංවිධානය (APO) අන්තර් ජාතික සංවිධානයක් ලෙස එහි සාමාජික රටවල කාර්මික හා කෘෂිකාර්මික ක්ෂේත්‍රයන්හි ඵලදායිතාව ඉහළ නැංවීමෙහිලා සහය ලබාදෙයි. මේ වන විට ආසියා හා පැසිෆික් කලාපයේ රටවල් 20 ක් එම සංවිධානයේ සාමාජිකත්වය ලබාගෙන ඇති අතර ශ්‍රී ලංකාව ද එහි සාමාජිකත්වය දරයි. අන්තර්ජාතික වශයෙන් ඵලදායිතාව ප්‍රවර්ධනය කිරීමෙහිලා මෙම සංවිධානය සුවිශේෂී මෙහෙවරක් ඉටුකරන අතර ඒ අතුරින් අන්තර්ජාතික සමුළු, සම්මන්ත්‍රණ, වැඩමුළු හා නොයෙකුත් අධ්‍යයන චාරිකා සංවිධානය කිරීම ප්‍රමුඛස්ථානයක් ගනු ලැබේ.

| වැඩසටහන | වැඩසටහන් ප්‍රමාණය | ප්‍රතිලාභීන් |
|---|---|---|
| Training | 49 | 67 |
| Observational Study Mission | 09 | 15 |
| Bilateral Cooperation Between NPOs | 1 | 03 |
| TES – Technical expert services (Green Productivity, Conference) | 2 | 650 |

## ආසියානු ඵලදායිතා සංවිධානයේ දායකත්වයෙන් 2014 වර්ෂය තුල පැවැත්වූ විශේෂ වැඩසටහන්

### 55th WorkShop Meeting of Heads of NPOs

ආසියානු ඵලදායිතා සංවිධානයට අයත් රටවල් 20 හි ඵලදායිතා සංවිධාන ප්‍රධානීන්ගේ සහභාගීත්වයෙන් 2014 ඔක්තෝම්බර් 21 සිට 23 දක්වා කොළඹ හිල්ටන් හෝටලයේ දී පැවැත්විනි. මේ සඳහා ආසියානු ඵලදායිතා සංවිධානයන්හි ප්‍රධානීන් , එම රටවල කෘෂිකාර්මික ක්ෂේත්‍රය නියෝජනය කරමින් නියෝජිතයින් හා උපදේශකවරු සහභාගි විය. මෙහිදී ආසියානු ඵලදායිතා සංවිධානයේ සමස්ථ උපායමාර්ග, ඵලදායිතා සංවිධාන සඳහා සහාය ලබාදීම හා ඔවුන් ශක්තිමත් කිරීම, නිෂ්පාදන සේවා හා කෘෂිකර්ම යන අංශයන්හි ඵලදායිතාව වර්ධනය සඳහා විශේෂිත වූ ව්‍යාපෘති හා වැඩසටහන් සැලසුම් කිරීම පිළිබඳව සාකච්ඡා කරන ලදී. මෙම වැඩමුළුව සඳහා වියදම් වූ මුදල රු 8,069,004.51 කි. එම වැඩමුළුව සඳහා පැමිණි ආසියානු ඵලදායිතා සංවිධානයේ ලේකම් මාරි අමානෝ මහතා ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයට පැමිණීම විශේෂ අවස්ථාවකි.







වැඩමුළුවේ විශේෂ අවස්ථා





ආසියානු ඵලදායිතා සංවිධානයේ මහලේකම් මාරි අමානෝ මහතා ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශයට පැමිණි අවස්ථාව

### ජාතික හරිත ඵලදායිතා සම්මේලනය

නිෂ්පාදන හා සේවා ආයතන වල සමස්ථ නිෂ්පාදනය ඉහළ දමමින් , නාස්තිය අඩුකරමින් පාරිසරික සම්පත් ආරක්ෂාකිරීම සහ ඒ තුළින් පරිසරය ආරක්ෂා කිරීම පිළිබඳව දැනුම ලබාදීම සඳහා ජාතික හරිත ඵලදායිතා සම්මේලනය පවත්වන ලදී. මෙම ක්ෂේත්‍රය නියෝජනය කරන 200 ක පමණ දෙනෙකුගේ සහභාගීත්වයෙන් මෙම සම්මන්ත්‍රණය පලමු වරට ශ්‍රී ලංකාවේදී 2014 ඔක්තෝම්බර් 09

දින පවත්වන ලදී. ඒ සඳහා ආසියානු ඵලදායිතා සංවිධානයේ විශේෂඥයින්ගේ දේශන 02 ක්ද දේශීය විශේෂඥයින්ගේ දේශන 05 ක් ද පවැත්විණි.මේ සඳහා වියදම් වූ මුදල රු 410,000 කි.



සමුළුවේ විශේෂ අවස්ථා

**දැනුම කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය**

ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය ආසියානු ඵලදායිතා සංවිධානයේ දැනුම කළමනාකරණය පිළිබඳ විශේෂඥයකුගේ සම්පත් දායකත්වයෙන් දැනුම කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණයක් 2014 .09. 05 දින ඉඩම් අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී පැවැත්විනි. ඒ සඳහා විවිධ ක්ෂේත්‍රයන් නියෝජනය කරමින් 120 දෙනෙකු සහභාගි විය. ඒ සඳහා දරන ලද වියදම 78,000.00 කි.

**දැනුම කළමනාකරණය විශේෂ ව්‍යාපෘතිය**

**දැනුම කළමනාකරණය විශේෂ ව්‍යාපෘතියක් ගම්පොළ දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක විණි. මාතෘ මරණ අනුපාතය තනි දශම ස්ථානයකට ගෙන ඒම හෝ ශුන්‍ය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුනයි.**



දැනුම කළමණාකාරන විශේෂ ව්‍යාපෘතියේ පුහුණු වැඩසටහන්

**ජාතික Lean සමුළුව ( Lean Summit 2014 )**

මූලික ඵලදායිතා සංකල්ප වලින් ඔබ්බට යමින් නිෂ්පාදන හා සේවා අංශ තුළ උසස් ඵලදායිතා ශිල්පක්‍රම යොදාගැනීම පිළිබඳ අවබෝධය හා අත්දැකීම් හුවමාරු කර ගැනීමේ අරමුණ ඇතිව ප්‍රථම වරට ශ්‍රී ලංකාවේදී මෙම සම්මේලනය ආසියානු ඵලදායිතා සංවිධානයේ විශේෂඥවරයෙකුගේ ද සම්පත් දායකත්වය ඇතිව 2014.11.15 දින සෙත්සිරිපාය දෙවන අධියරේ ශ්‍රවනාගාරයේදී පැවැත්විණි.

මේ සඳහා මූලික ඵලදායිතා සංකල්ප පිළිබඳ දැනුම ඇති රාජ්‍ය හා පෞද්ගලික අංශය නියෝජනය කරමින් නිලධාරීන් 200 ක් පමණ සහභාගිවිය.





Lean සමුළුවේ විශේෂ අවස්ථාවන්

**සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ සමුළුව**

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ සමුළුව 2014 දෙසැම්බර් මස 15 දින සිට 17 වන දින පෙ.ව 9.00 සිට ප.ව 4.30 දක්වා සෙත්සිරිපාය දෙවන අදියර ප්‍රධාන ශාලාවේදී පවත්වන ලදී.

මෙහිදී විදේශ නියෝජිතයින් විසි දෙනෙකු හා ශ්‍රී ලාංකීය නියෝජිතයින් හය දෙනෙකු සිය විශිෂ්ට අත්දැකීම් ශ්‍රී ලාංකීය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 200 ක පමණ පිරිසක් සමග හුවමාරුකරගන්නා ලදී.

මෙහිදී එස් 5, ISO,MIS,GMP,Kaizen, දැනුම කළමනාකරණය, Supply Chain Management, Industrial Engineering, Technology upgrading, හරිත නිෂ්පාදන (Green Product, Lean Manufacturing practices, Material flow, cost Accounting, Innovation ආදී සංකල්ප වල විශිෂ්ට අත්දැකීම් ලෙස හුවමාරු කරගන්නා ලදී.

මෙම සමුළුව ශ්‍රී ලාංකීය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් හට නවමු අත්දැකීමක් විය.



සමුළුව සංවිධායක මණ්ඩලය



සමුළුවේ අවස්ථාවක්

## 5 විශේෂ අවස්ථා සහ වැඩසටහන්

ටැන්සනියානු ඵලදායිතා නිලධාරීන් ශ්‍රීලංකාව සමග විශිෂ්ය අත්දැකීම් හුවමාරු කරගැනීමට පැමිණීම විශේෂ අවස්ථාවකි. එහිදී කොකා කොලා ආයතනය සහ ඵලදායිතා සම්මාන ලබාගත් හිග්ගස්වත්ත විද්‍යාලයේ ක්ෂේත්‍ර චාරිකා සිදුකරන ලදී.



ක්ෂේත්‍ර චාරිකාව - හිග්ගස්වත්ත විද්‍යාලය



ක්ෂේත්‍ර චාරිකාව - කොකා කොලා ආයතනය

## 5.1 දැයට කිරුළ

ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ දැයට කිරුළ සඳහා කුරුණෑගල, පුත්තලම සහ කෑගල්ල දිස්ත්‍රික්කවල අධ්‍යාපන, රාජ්‍ය සහ පුද්ගලික අංශ නියෝජනය කරමින් 2013 වර්ෂයේ දී පවත්වන ලද වැඩසටහන් ඉදිරියට ක්‍රියාත්මක කරයි. ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ කුටිය ඵලදායිතා සංකල්ප පිළිබඳ ජනතාව දැනුවත් වන පරිදි නිර්මාණය කරන ලද අතර, පාසල් ළමුන් ඇතුළු විශාල පිරිසක් එම කුටිය නැරඹූහ.



ඵලදායිතා ලේකම් කාර්යාලයේ කුටිය






දැයට කිරුළ ප්‍රදර්ශන කුටියේ කාර්ය මණ්ඩලය

## 6 ඵලදායිතාව සම්බන්ධ ප්‍රචාරණ කටයුතු

ඵලදායිතා සංකල්ප ජනතාව වෙත ගෙන යාම සඳහා ඵලදායිතා ලේකම් කාර්යාලය විවිධ මාධ්‍ය භාවිතා කරයි. ඒ තුළින් ඵලදායිතාවය පිළිබඳ ජනතාවගේ දැනුම වැඩි කිරීමට බලාපොරොත්තු වේ. සඵල පුවත්පතේ විශේෂ කලාපයක් 2012/2013 ඵලදායිතා සම්මාන උළෙල වෙනුවෙන් එළිදක්වන ලදී.

**“සඵල ” පුවත්පත**










**ඵලදායිතා ලේකම් කාර්යාලයේ ප්‍රකාශන සඳහා දරන ලද වියදම**

| අයිතම | වියදම |
|---|---|
| සඵල පුවත්පත් | 294,000.00 |
| පුහුණු කාලසටහන් පොත් (750) | 38,556.00 |
| 3R පෝස්ටර් (20000) | 45,000.00 |
| ප්‍රවර්ධන බැනර් (70) | 97,000.00 |
| හරිත ඵලදායිතා පොත | 130000.00 |
| 5 s කුඩා පෝස්ටර් | 60000.00 |
| 3 R පොඩි පෝස්ටර් | 80,424.00 |
| නයි ඉනිමන් මංපුවරු (Ludo Board ) (2,60,000) | 1646400.00 |
| 5 s විශාල පෝස්ටර් (10000) | 106243.20 |
| 5 s සිංහල පොත (15,000) | 210000.00 |
| පුවත් පත් දැන්වීම් | 1087940.00 |
| එකතුව | 3,795,563.20 |






ඵලදායිතා සංකල්ප සහ ක්‍රියාකාරකම් දරුවන් අතර ප්‍රචලිත කරනු පිණිස විජය පුවත්පත සමග ලුඩෝ පුවරුවක් බෙදාහරින ලදී. ප්‍රාථමික ශ්‍රේණි වල පාසල් ළමුන් අතර මෙය බෙහෙවින් ජනප්‍රිය විය.

ඵලදායිතා සංකල්ප තුළ ඉතා වැදගත් වන හරිත ඵලදායිතාවය පිළිබඳ සිංහලෙන් ලියවුන පොතක අවශ්‍යතාවය සැපිරීම සඳහා සඳහා 2014 වර්ෂය තුළ හරිත ඵලදායිතාවය පොත පල කරන ලදී